INTRODUCING 1st TIME IN UK
FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane,
(Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

Fly to Colombo

| | |
|---|---|
| Srilankan Air | £ 380 |
| Qatar Air | £ 290 |
| Kuwait Air | £ 260 |
| Oman Air | £ 190 |
| Ethihad Air | £ 350 |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 42000 |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip 07551549559
0208 150 9183
Call us 0800 612 4045 info@faredealtravels.co.uk
ETIHAD AIRWAYS Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS



## කොළඹ හිඟන්නන්ට හරි නරක දසාවක්

### දෙමසක් තුළ අට දෙනෙක් මරලා

මහ කොළඹ නගරය තුළ හා ගල්කිස්ස, රත්මලාන ආදී පෙදෙස්වල ද යාචකයින් ඝාතනය කිරීමේ රැල්ලක් පැතිරෙන බව වාර්තා වෙයි. මේ දෙමස තුළ සිදුකර ඇති අට වෙනි යාචක මරණය ගිය සතියේ ගල්කිස්සෙන් වාර්තා විය. එහෙත් පොලීසියට මේ මිනීමැරුම් සඳහා තවම කිසිදු සැක කරුවෙකු අල්ලා ගැන්මට හැකිවී නැත. කොල්ලුපිටියෙන් හිඟන්නන් දෙදෙනෙකුද, කොම්පඤ්ඤවීදියෙන් දෙදෙනෙකුද, මරදානෙන්, කොටහේනෙන්, වැල්ලවත්තෙන් සහ ගල්කිස්සෙන් එක්කෙනෙකු බැගින්ද වශයෙන් යාචකයින් අට දෙනෙකි.

මේ මරණ සියල්ලම සිදුකර ඇත්තේ හිස මතට ලොකු ගලක් අත හැරීමෙන් හෝ හිසට කිසියම් මොට්ට ආයුධයකින් පහරදීමෙන් හෝ බැව් පොලීසිය කියයි. එසේම යාචකයින් අත තිබූ ඉතා සුළු මුදල් ප්‍රමාණයන්ද පැහැරගෙන ගොස් ඇත. මෙය යාචකයින්ගේ මුදල් කොල්ලකෑමම පරමාර්ථය කරගත් වීදිගානේ හැසිරෙන කිසියම් කෙනෙකුගේ වැඩක් ලෙස පොලීසිය සිතයි. එක් යාචක මරණයක් ළඟ වැටී තිබුණු කැප් එකක් නිසා එය අයිති තැනැත්තා හඳුනාගෙන ඇතත් ඔහු දැනට සැඟව හිඳී. පොලීසිය දැන් ඒ සැක කරුවා පසුපස පන්නයි.

## කේ පී ගෙන් ගත් මුදල් කොපමණද? රනිල් රජයෙන් අසයි

දැනට අත්අඩංගුවේ සිටින එල්ටීටීඊයේ ආයුධ වෙළෙන්දා වන කුමාරන් පද්මනාදන් හෙවත් කේ පී ගෙන් ශ්‍රීලංකා රජය සොයාගත් මුදල් ප්‍රමාණය කොතෙක්දැයි හෙළිකරන ලෙස විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ගිය සතියේ පාර්ලිමේන්තුවේදී ඉල්ලා සිටියේය. ඔහුට නැව් 18 ක්ද, පැට්‍රල් ස්ටේෂන් 500 ක්ද වූ බවත්, ඉන් ඉපයූ කෝටි ගණනක් මුදල් රජයට දැන් හමුවී ඇත්නම් ඒ මුදල් රණවිරුවන්ගේ යහපතට යෙදවිය යුතු බව ද රනිල් කීය. අපි වෙනුවෙන් අපි අරමුදලෙන් තැනූ ගෙවල් රණවිරුවන්ට මේ රජය විකුණා ඇතැයිද ඔහු චෝදනා කළේ ය.

MINOLANKA PROUDLY PRESENTS



Roshan Fernando with
FLASHBACK
FIRST TIME IN LONDON UK
SURENDRA AND AMILA
OPEN LIVE STAGE OUT DOOR MUSICAL EXTRAVAGANZA
25th of September at 6.00 pm
HARROW LEISURE CENTRE
Charistchurch Avenue, London HA3 5BD
Shantha - 07817409520 Sudesh - 07737192123 Kumudu - 0791202862 Sanjee - 07595901588
Main Sponsors MCG FAST CASH
Co-Sponsor FareDeals Travel & Tours Fly With Someone You Trust
Electronic media sponsor www.sesatha.co.uk
Minolanka

## ♥ පැටියෝ ඩාලිං



"පැටියෝ ඔයා දන්නවද? මේ ලෝකෙ තියන හැම නමකම හොඳ තේරුමක් තියනවා....."

"හොඳයි එහෙනම් කියන්න... අර මහ ලේකම් බැංකි මූන්ගෙ නමේ තේරුම මොකක්ද...?"

"බැංකි මූන් කියන්නෙ..... මූණ බංකුවක් වගේ කියන එකයි......."

"හරියට හරි...ඒ මූණ බංකුවක් වගේ තමයි..... හතරැස්.... බිම තියලා ඉඳගන්න පුළුවන්...."

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 4ZJ, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

## Sinhala Lesson 11 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රීසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

### Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෘ ෲ
ෙ ේ ෛ ො ෝ

| | | | |
|---|---|---|---|
| ප | පා | පැ | පෑ |
| pup / super | park | pat | pan |

| | | | | |
|---|---|---|---|---|
| පි | පී | පු | පූ | පෙ |
| pin | peep | put | pool | pen |

| | | | |
|---|---|---|---|
| පේ | පො | පෝ | ප් |
| pay | pond | post | up |

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 120

**හරහට :**
1 දෙගිඩියාව 5 එළවලුවකි
6 දෝෂය හෝ අකටයුත්ත
8 මහත සිරුරැති 9 මායිම්
10 ඇඳුම් මැද මෙසේ තබති

**පහළට :**
1 ඉතා සුළු වේලාවකින්
2 හතර පද යනු මේවාය
3 භික්ෂූන්වහන්සේ
4 බිළිඳා මෙසේ ද හඳුන්වති
7 සිංහළ අවුරුද්දට දැකිය හැක
8 අනුන් නොවේ

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | ■ | 4 |
| 5 | | | ■ | |
| | ■ | 6 | 7 | |
| ■ | 8 | | | |
| 9 | | ■ | 10 | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට :** 1 නිසි 3 කුජ 5 තසිම 7 නායක 9 සීපද 10 ලෝල 11 මතු
**පහලට :** 1 නිතර 2 සිසි 4 ජනක 6 මනාප 8 යදම 9 සීල

### නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## අල සහ ගෝවා ව්‍යංජනය
## Potato & Cabbage Curry

**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | |
|---|---|
| සාමාන්‍ය අර්තාපල් ගෙඩි | 5 ක් |
| ලොකු ගෝවා ගෙඩියකින් | ½ ක් |
| බොම්බයි එණු තරමක ගෙඩි | 1 ක් |
| කහ කුඩු ස්වල්පයක් | |
| අබ ස්වල්පයක් | |
| උළුහාල් තේ හැඳි | 2 ක් |
| උම්බලකඩ මේස හැන්දක් | |
| රම්පෙ හා කරපිංචා | |
| අමු මිරිස් කරල් | 3 ක් |
| පොල්කිරි මිටිකිරි කෝප්ප | 1 ක් |
| ලුණු අවශ්‍ය පමණට | |

**සාදන ක්‍රමය:** අල සොදා පොතුහැර තරමක කුඩා කැබලිවලට කපාගන්න. ගෝවා බාගය සෝදා තරමක තීරුවලට කපන්න. එණු ගෙඩිය සිහින්ව ලියා ගන්න. අමු මිරිස් කරල් දෙකට පලා ඇට පිහි තුඩකින් ඉවත්කරන්න. ඉන්පසු ඒ මිරිස් සිහිනියට ලියාගන්න.

පළමුව කැපූ අල ටික භාජනයකට දමා එය තැම්බෙන පමණට වතුර දමා ලිප තබන්න. එය බාගෙට තැම්බී ගෙන එනවිට වතුරද හිඳීගෙන එද්දී ගෝවා හැර ඉතිරි සියළු කළමනා එයට එක්කර හොඳට කළවම්කර භාජනය වසා ටික වේලාවක් තබා අන්තිමට ගෝවා එක්කරන්න. මුලින් ගෝවා නොදමන්නේ ඒවා ඉක්මනින් තැම්බී ඉතා මොලොක් වන නිසාය. එය තැම්බීගෙන එද්දී කිරි එකතුකරන්න. හොඳින් කළවම් කර ඉස්ම මඳක් හිඳෙන කල් ලිප මත තබා බාගන්න.

♦ චිත්‍රා රමණී ගමගේ London NW2